# අපූරු යහළුකම



**කෞමදී ජයශානි රත්නායක**

# අපූරු යහලුකම

කෞමදී ජයශානි රත්නායක

**30.12.2023**

# පිදුම

මට හැමදාම ආදරය කරන මගෙ අම්මටත් අප්පච්චීටත්, මගේ ඉස්කෝලේ පාන්තිබාර ගුරුමැණියන්ට සහ අප පාසලේ ප්‍රධානාචාර්ය ගුරු මැණියන් ඇතුළු සියලුම ගුරු මැණිවරුන්ට සහ ගුරු පියවරුන්ටත්, මගේ පන්තියේ සියලුම යහලුවන්ටත්, මගේ පෙරපාසලේ ප්‍රධානාචාර්ය ගුරු මැණියන් අතුලු සියලූම ගුරුමැණියන්ටත්, මගේ පෙරපාසලේ සියලූම යහලුවන්ටත් මෙම අපූරු යහලුකම කතාව බැති සිතින් පුදමි.

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි

ශෂිකලා සේනාධීර

විදුහල් පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 10 20

# අපූරු යහළුකම

එක කැලෑවක හිටියා හා පැංචෙක් ඉතින් එයා හරිම ආසයි කැරට් කන්න. ඉතින් එයා කැරට් හොයන්න පිනුම් ගගහා පැන පැන යනකොට එයාව දැක්කා සිංහරාළ.



සිංහරාළ අද නම් මට හොඳ කෑමක් හම්බුනා කියලා දුවගෙන දුවගෙන ගිහිල්ලා හා පැංචව අල්ලගත්තා. අනේ පව් අහිංසක හා පැංචා හොඳටම බය වෙලා අඩනවා.



අනේ මන් හරිම අහිංසකයි, මන් ආසයි කැරට් කන්න, මන් කැරට් හොයන්න යන ගමන්, අම්මා මාව හොයයි මට යන්න දෙන්න. හා පැංචා සිංහරාළට කීවා.



නෑ නෑ එහෙම කොහොමද යන්න දෙන්නේ, මට හුඟ දවසකින් කෑමක් හම්බුනේ නෑ, අද මට රසට හා මස් කන්න පුළුවනි කියලා සිංහරාළ සතුටින් කීවා.



අනේ හා පැංචා කෑ ගහන සද්දෙ ඉබි පැංචට ඇහිලා හා පැංචා ගැන හොඳටම දුක හිතුනා.



ඉබි පැංචා හිමින් සැරේ එතෙන්ට ඇවිත් සිංහරාළට කීවා "අනේ සිංහ රාළ හා පැංචා වෙනුවට මාව කන්න, හා පැංචට යන්න දෙන්න" .

"ආ.. හා මස් වෙනුවට ඉබි මස් හොඳයි. මන් කැමති" කියලා හා පැංචව අතැරල ඉබි පැංචා දිහාවට පැන්නා.



සිංහ රාළ පනිද්දිම ඉබි පැංචා කට්ට ඇතුළට රිංග ගත්තා. හා පැංචා පැනල දිව්වා.

අනේ පව්, සිංහරාළ ඉබි පැංචා එහෙට මෙහෙට හැරෙව්වා ඒත් ඉබි මස් කන්න හම්බුනේ නෑ. සිංහරාළට ඉබි මස් එපා වෙලා යන්න ගියා.



සිංහරාළ ගියාට පස්සේ ඉබි පැංචා හිමීට එළියට ආවා.

ඉතින් එදා ඉඳලා ඉබි පැංචායි හා පැංචායි හොඳ යාලුවෝ උනා.





පසුවදන

නුතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නුතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20